චක්‍රලේඛ අංක1995/34

අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය
'ඉසුරුපාය', ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ,
බත්තරමුල්ල.

1995. 12. 04

අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය චක්‍රලේඛ අංක 1995/34

01 සියලුම රජයේ පාසල්වල විදුහල්පතිවරුන්,
02 සියලුම පිරිවෙන්වල පරිවේනාධිපති ස්වාමීන් වහන්සේලා හා
03 රජයේ ආධාර ලබන උපකෘත පාසල්වල විදුහල්පතිවරුන් වෙත

## ගුරු අභිමානී නමින් නව රක්ෂණ ක්‍රමයක් හඳුන්වා දීම.

මුදල්, සැලසුම්, ජන වාර්ගික කටයුතු හා ජාතික ඒකාග්‍රතා අමාත්‍යාංශයත්, අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයත්, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවත් ඒකාබද්ධව "ගුරු අභිමානී" නමින් නවතම රක්ෂණ ක්‍රමයක් ආරම්භ කිරීමට විධි විධාන යොදා ඇත. මෙම නව රක්ෂණ ක්‍රමය ගුරු භවතුන්ගේ අනාගත යහපත සඳහා ක්‍රියාත්මක කරන අතර, එමගින් පාසල්වලට ද විශාල ප්‍රතිලාභ ලබාගැනීමට හැකිවනු ඇත. එබැවින් මෙම චක්‍රලේඛ උපදෙස් ඔබ පාසලේ සියලුම ගුරු භවතුන්ට දැන ගැනීමට සලස්වන්න.

02 මෙම ගුරු අභිමානී රක්ෂණ ක්‍රමය බොහෝ දුරට ජීවිත රක්ෂණ ක්‍රමයට සමාන වන අතර, රිසි පරිදි රක්ෂණ ඔප්පුවක් ලබාගෙන බල රහිත නොවී, ක්‍රියාත්මක තත්ත්වයක පවතින්නේ නම්, පහත දැක්වෙන ප්‍රතිලාභ ලබාගැනීමට හැකිවනු ඇත.

- i හදිසි අනතුරක් සඳහා රුපියල් ලක්ෂයක් දක්වා වන වන්දි මුදලක් ලබාගත හැකිවීම.
- ii ගුරු භවතාට හා ඔහුගේ පවුලේ සාමාජිකයන්ට වර්ෂයකට රු 22,000 ක් දක්වා වන සැත්කම් හා රෝහල් වියදම් ප්‍රතිපූර්ණයක් ලබාගත හැකිවීම.
- iii රක්ෂණ ඔප්පුව ලබාගත් පසු අදාළ සාමාජිකයා සහ සාමාජිකයාගේ මවගේ, පියාගේ, කලත්‍රයාගේ හෝ දරුවකුගේ මරණයකදී අවමංගල්‍ය කටයුතු සඳහා රු 3,000 ක ආපසු අය නොකරන ප්‍රදානයක් ලබාගත හැකිවීම.
- iv රක්ෂණ ඔප්පුව ලබාගත් සාමාජිකයාගේ ඇස් පෙනීම දුර්වල වුවහොත් උපැස් යුවළක් මිළ දී ගැනීම සඳහා ආපසු අය නොකරන රු 2,000 ක දීමනාවක් ලබාගත හැකිවීම.
- v රක්ෂණ ඔප්පුව ලබාගත් සාමාජිකයාගේ වයස හා සේවා කාලය අනුව, රක්ෂණ ඔප්පුව කල් පිරුණු පසු රු 50, 000 ක එකවර ගෙවන දීමනාවක් ලබාගත හැකිවන සේ දීමනාව එකවර ලබා නොගන්නේ නම් එය වසර 05 ක කාලයක් තුළ මසකට රුපියල් 1050 ක් බැගින් ලබාගත හැකිවීම.

03 මෙම "ගුරු අභිමානී" රක්ෂණ ක්‍රමය ද මහජන බැංකුව හා ඒකාබද්ධව ක්‍රියාත්මක කරන ලද "ගුරු සෙත" යෝජනා ක්‍රමයට සමාන ආකාරයෙන් ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වේ. මගේ අංක 4/මු6/213 හා 1985. 10. 21 දාතම චක්‍රලේඛය ක්‍රියාකර කොට්ඨාශ අධ්‍යාපන කාර්යාලය/ කළාප අධ්‍යාපන කාර්යාලය/ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින්, එක් එක් පාසල/පිරිවෙන වෙනුවෙන් පිළියෙල කර එවනු ලබන ශේෂ ගුරු වැටුප සඳහා වන චෙක්පත, අදාළ බැංකු ශාඛාවේ, අදාල විදුහල නමින් පවත්වා ගෙන යන ගුරු වැටුප් බැංකු ගිණුමේ තැන්පත් කළ යුතුය. අනතුරුව, ගුරු වැටුප් ලැයිස්තුව අනුව එක් එක් ගුරු භවතා සඳහා ශේෂ වැටුපට චෙක්පත් ලියා ගුරු භවතුන්ට භාරදිය යුතුය. නමුත් මෙහිදී අදාළ ගුරු වැටුප් ලැයිස්තුවේ සඳහන් වන ශේෂ වැටුප සඳහාම චෙක්පත් නොලියා පහත දක්වෙන ව්‍යාපෘති/යෝජනා ක්‍රම සඳහා දායක වන ගුරු භවතුන්ගේ, ඔවුන්ගේ කැමැත්ත පරිදි, නියමිත වාරික (රක්ෂණ වාරිකය, ණය වාරිකය හා සාමාජික දායක මුදල් වාරිකය) අඩුකර තවදුරටත් ගෙවිය යුතු ශේෂ වැටුප සඳහා පමණක් චෙක්පත් ලියා ගුරු භවතුන්ට භාරදිය යුතුය.

එම ව්‍යාපෘති යෝජනා ක්‍රම

i විදුහල්පති සමූපකාර සමිති, සුබ සාධන සංගම් ආදියට අයකරන දායක මුදල්
ii "ගුරු සෙත" සංවිධානයට අදාලව අයකරන දායක මුදල් හා සාමාජික මුදල්
iii "ගුරු අභිමානී" රක්ෂණ ක්‍රමයට දායකවන රක්ෂණ වාරික මුදල්

මීට අදාලව සෑම විදුහලකම ඇමුණුම් 1 හි දක්වෙන ආකාරයට (උදාහරණයක්) ගුරු වැටුප් බැංකු ගිණුම සඳහා වන මුදල් පොත පවත්වාගෙන යා යුතුය. ගුරු භවතාට ගෙවිය යුතු ශේෂ වැටුප සඳහා වන චෙක්පත, ගුරු සෙත සංවිධානය ක්‍රියාත්මක කිරීමට අදාළව මෙම අමාත්‍යාංශයෙන් නිකුත් කරන ලද, අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛ අංක 1995/17 හි, 03:III ඡේදයේ දක්වෙන ආකාරයට ලියා නිකුත් කළ හැකිය.

04 මෙම ගුරු අභිමානී රක්ෂණ ක්‍රමයට දායක වන සියලුම ගුරු භවතුන් තමන්ට හිමි ශේෂ වැටුපෙන් රක්ෂණ වාරිකය අයකර ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවට යැවීම සඳහා,............. තොරව, වලංගු කළ නොහැකි බලය පැවරීමේ ලිපියකින් අත්සන් කර බාරදිය යුතුය. එය පිටපත් දෙකකින් යුක්තව පළාත් මට්ටමින් රක්ෂන නිලධාරියාට බාරදෙන්න. එහි මුල් පිටපත රක්ෂණ සංස්ථාවට බාරදිය යුතු අතර දෙවැනි පිටපත් වැටුපෙන් රක්ෂන වාරිකය අය කර ගැනීමට අදාලව ගුරු භවතා දනට සේවය කරන විදුහලේ විදුහල්පතිවරයාට භාර දිය යුතුය. විදුහලිපතිවරයා රක්ෂණකරුවන්ට ලැබෙන බලය පැවරීමේ ලිපි ගුරු අභිමානී රක්ෂණ ගොනුවේ මතු ප්‍රයෝජනය සඳහා සුරක්ෂිතව ගොනුකර තබා ගත යුතුය.

05 ගුරු මාරුවීම් වලදී, අදාල රක්ෂණ ඔප්පුව අප්‍රාණික/බල රහිත තත්ත්වයට වැළැක්වීම සඳහා, රක්ෂණ ඔප්පුව හිමි ගුරුභවතා විසින්, ගුරු මාරුවීමට අදාල විස්තර රක්ෂණ සංස්ථාවටත්, දනට සේවය කරන විදුහලේ විදුහල්පතිවරයාටත්, අලුතින් මාරුවී යන විදුහලේ විදුහල්පතිවරයාටත්, ලිඛිතව දනුම් දිය යුතුය. එසේ නොකළහොත් අදාල රක්ෂණ ඔප්පුව අප්‍රාණික/බල රහිත තත්ත්වයට පත්වීම තුළින් සඳහන් කරන ලද ප්‍රතිලාභ ලබා ගැනීමට නොලැබෙනු ඇත. ගුරු මාරුවීම් වලදී අලුතින් මාරු වී යන විදුහලේ විදුහල්පතිවරයාට ද, කල්තබා දනුම් දීමකින් තොරව අවලංගු කළ නොහැකි වැටුපෙන් රක්ෂණ වාරික අයකර ගැනීමට බලය පවරන ලද, නව බලය පැවරීමේ ලිපියක් අත්සන් කර බාරදිය යුතුය.

06 "ගුරු අභිමානී" රක්ෂණ ක්‍රමයට අදාල මුදල් අඩුකිරීම්, චෙක්පත් "ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව" නමින් ලියා, ඔබගේ පළාතේ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ ප්‍රාදේශීය කාර්යාලයේ, කළමණාකරු වෙත කරුණාකර යවන්න. "ගුරු අභිමානී" ක්‍රමය පිළිබඳව වැඩිදුර විස්තර දනගැනීම සඳහා ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙන් නිකුත් කරන ලද "ගුරු අභිමානී" විස්තර පත්‍රිකාව කරුණාකර බලන්න.

(අත්සන් කළේ)
වී. සුදසිංහ,
නියෝජ්‍ය ප්‍රධාන ගණකාධිකාරී

අ.ක./එම්. ඩී. ඩී. පීරිස්
අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාශයේ
ලේකම්

පිටපත්
1 විගණකාධිපති - ද. ගැ. ස.
2 සභාපති, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව - ද. ගැ. ස.
3 ගණකාධිකාරී (අභ්‍යන්තර විගණන) - ද. ගැ. ස.
4 සියලුම පලාත් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්වරුන් - ද. ගැ. ස.
5 පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් - ද. ගැ. ස.
6 සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් - ද. ගැ. ස.
7 සියලුම කොට්ඨාශ කාර්යාල භාර නි. අ. අ. වරුන් ද. ගැ. ස.
8 සියලුම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවල ප්‍රධාන ගණකාරීවරුන් - ද. ගැ. ස.
9 සියලුම කලාප/කොට්ඨාශ ගණකාධිකාරීවරුන්/මුදල් සහකාරවරුන් - ද. ගැ. ස.
10 විධායක අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව - ඔබගේ අංක ගුරුඅභිමානී/14
ගොනුවට අදාළව

# 1995 ඔක්තෝබර් මස ගුරු වැටුප් ගෙවීම් ජංගම බැංකු ගිණුමේ මුදල් පොත

| දිනය | මුදල් ලැබුණේ කාගෙන්ද | මුදල් භාරගත් රිසිට් අංකය | ලැබුණු මුදල | | දිනය | ගෙවන අයගේ නම | චෙක්පත් අංකය | ගෙවන මුදල | | පළමු අත්සන්කරුගේ කෙටි අත්සන | දෙවන අත්සන්කරුගේ කෙටි අත්සන |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 95. 10. 20 | කලාප අධ්‍යාපන | 0010 | 55520 | 00 | 95. 10. 20 | ජයන්ති ගලප්පත්ති | 000101 | 6800 | 00 | | |
| | | | | | 95. 10. 20 | චින්තා වසන්ති | 102 | 5450 | 00 | | |
| | | | | | 95. 10. 20 | තිලක්ෂි උපමාලි | 103 | 5300 | 00 | | |
| | | | | | 95. 10. 20 | සරෝජා අංජලි | 104 | 5300 | 00 | | |
| | | | | | 95. 10. 20 | නදීෂා සූරවීර | 105 | 5180 | 00 | | |
| | | | | | 95. 10. 20 | උපේක්ෂා සූරවීර | 106 | 5200 | 00 | | |
| | | | | | 95. 10. 20 | ස්වර්ණා ජයවීර | 107 | 5140 | 00 | | |
| | | | | | 95. 10. 20 | ආර්. එම්. රණසිංහ | 108 | 5900 | 00 | | |
| | | | | | | විදුහලේ ශුභ සාධක සමිතිය ගිණුමට | 109 | 800 | 00 | | |
| | | | | | 95. 10. 20 | විදුහලේ සමුපකාර සමිතියේ ගිණුමට | 110 | 2600 | 00 | | |
| | | | | | 95. 10. 20 | ගුරු සෙත ගිණුමට මහජන බැංකුවට | 111 | 6450 | 00 | | |
| | | | | | 95. 10. 20 | ශ්‍රී ලංකා රක්ෂණ | 112 | 1400 | 00 | | |
| | | | | | 95. 10. 20 | සංස්ථාව | | | | | |
| | | | | | 95. 10. 20 | ගුරු අභිමානී රක්ෂණ ක්‍රමය | | | | | |
| | | | 55520 | 00 | | | | 55520 | 00 | | |

සටහන : මේ අනුව ගුරු වැටුප් ජංගම බැංකු ගිණුමේ මුදල් ඉතිරිවීමක් සිදුවිය නොහැක.

ශි/4